**දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය**

**තනතුරු ඇබෑර්තු**

**104-09 වැ.ප. 111 ශ්‍රේණියේ අයකැමි තනතුර සදහා අයදූම්පත් කැදවීම**

සී/ය දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතියේ පූරප්පාඩු වී ඇති තනතුර සඳහා සුදුසුකම්ලත් අයෙකු බදවා ගැනීමට 2024.06.14 දින සිට 2024.06.30 දින දක්වා සමිති බල ප්‍රදේශය තුල වසර දෙකක ස්ථිර පදිංචිය සහිත බාහිර අයදුම්කරුවන් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. සමූපකාර සේවක කාර්යය විධිවාධාන 1.2.2 වගන්තියට අනුව සමිතියේ අභ්‍යන්තර සේවකයන් හට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

| තනතුර | වැ.ප අංකය හා ශ්‍රේණිය | පූරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| අයකැමි | 104 - 09 111 ශ්‍රේණිය | 01 | 21284 - 575x10-675x10-800x10-41,784/= |

02. මෙම තනතුර ස්ථිරය.සමූපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.

03. බඳවාගැනීමේ සුදුසුකම්

(අ) සමූපකාර සේවක 105-10 වැටුප් පරිමාණයේ ක්ෂේත්‍රයට අදාල ස්ථිර තනතුරකවසර 05ක සතුටුදායක සෙවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ආ) ගණිතය හා සිංහල භාෂාව ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව අ.පො .ස (සා.පෙළ )විභාගයෙන් විෂයන් හයකින් සමත් වීම සහ පිළිගත් ආයතනයක එක් වසරක අයකැමි තනතුරෙහි පළපුරුද්ද ලබා තිබීම .

04. වයස් සීමාව - අවු. 18-45 (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සමූපකාර ක්ෂේත්‍රයේ ස්ථිර අයදුම්කරුවනට උපරිම වයස් සීමාව බලනොපානු ලබයි.

05. බදවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

06. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර බදවා ගැනීමේ නීතිරීති අනුව යම් අයදූම්කරුවකු නුසුදුසු බව අනාවරණය වූවහොත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදූම්පත හෝ ලබාදී ඇති පත්වීම අවලංගු කල හැකිය.

07. වෙනත් සමූපකාර සමිතියක සේවයේ නියුතු ස්ථිර සේවකයකු අයදූම්පත් යොමු කරන්නේ නම් තම අයදූම්පත අයදුම්කරු දැනට සේවය කරන සමිතිය හරහාම එවිය යුතු වේ. වෙනත් සමිතියක සේවකයකු සෘජුවම ඉදිරිපත් කර ඇති අයදූම්පත් කිසිදු හේතුවක් නිසාවත් සළකා බලනු නොලැබේ.

08. අයදූම් පත්‍රය යොමු කිරීම

අයදූම් පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ සී/ය දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතියේ 104.9 වැටුප් පරිමාණයේ 111 ශ්‍රේණියේ අයකැමි තනතුර සදහා බදවා ගැනීම යන්න සදහන් කල යුතුය.

**සම්පූර්ණ කරන ලද අයදූම් පත්‍රය 2024.06.30 දිනට හෝ පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය (අතින් ගෙනවිත් භාරදීමටද හැකියාව ඇත.) මෙදිනට පසුව ලැබෙන අයදූම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.**

සභාපති,
සී/ය දූනාගහ පොල් නිපදවන්නන්ගේ,
සමූපකාර සමිතිය

..............................දින සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේසමූපකාර සමිතිය

දූනාගහ. දූ.අ 031-2246564 , 031-2243802